අල්ලාහ් අබියස මෙලොව මැස්සෙකුගේ පියාපතකට හෝ සමාන වන්නේ නම්, දෙවියන් ප්රතික්ෂේප කරන කිසිවකුට එහි කිසිදු ජල පානයක් හෝ සපයන්නේ නැත.

සහ්ල් ඉබ්නු සඃද් අස්සාඉදී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී, මෙය
මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “අල්ලාහ් අබියස මෙලොව මැස්සෙකුගේ පියාපතකට සමාන
වන්නේ නම්, දෙවියන් ප්රතික්ෂේප කරන කිසිවකුට එහි කිසිදු ජල පානයක් හෝ සපයන්නේ නැත."
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ අල්ලාහ් අබියස මෙලොව ඉතා පහත් බවත් එයට කිසිදු වටිනාකමක් නොමැති බවත් පැහැදිලි කොට ඇත. අල්ලාහ් අබියස කිසියම් හෝ වටිනාකමක් ඇත්නම් ඔහුව ප්රතික්ෂේප කරන පුද්ගලයකුට ජලය සපයන්නේ නැත. එය මිනිසාට භුක්ති විඳීමටත් එහි ඇති යහපත් දෑ රසවිඳීමටත් අතිරේක වශයෙන් ලබා දුන්නකි. එබැවින් අල්ලාහ් අබියස මෙලොව ඉතා අල්ප දෙයකි. නමුත් මතුලොව ඊට වෙනස්ය. එය දෙවියන් ප්රතික්ෂේප කරන්නන් හට නොව දෙවියන් විශ්වාස කරන්නන් සඳහා වූ සදා සැප පහසුකම් ඇති නිවහනකි. එහෙයින් දෙවියන් කෙරෙහි විශ්වාසය තබන්නන් මෙලොවෙහි යථාර්ථය අවබෝධ කර ගත යුතුය. එයට වහල් නොවිය යුතුය. එය විනාශ වී යන්නකි සදාතනික නොවේ. එහෙයින් සදාතනික මතුලොවෙහි සතුටින් ජීවත් වනු පිණිස ඒ සඳහා වූ මෙවලමක් ලෙස මෙලොව භාවිත කළ යුතු වේ. (තවද යමකින් ඔබලාට දෙනු ලැබූ දෑ එය මෙලොව ජීවිතයේ භුක්ති විඳීමක් හා එහි වූ අලංකාරයකි. අල්ලාහ් වෙත ඇති දෑ ශ්රේෂ්ඨය වඩා ස්ථායීය. ඔබලා වටහා නොගන්නෙහු ද? අපි යමෙකුට අලංකාර ප්රතිඥාවක් දී එය ලබන තැනැත්තා, මෙලොව සම්පත් අපි ඔහුට භුක්ති විඳීමට සළස්වා පසුව මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔහු ඉදිරිපත් කරනු ලබන්නන් අතරින් වන්නෙකු මෙන් ද?) අල් කසස් 28:60,61.

http://sunnah.global/hadeeth/si/show/3695